# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 - 02 - 27

පැමිණිලිකරු : මහේෂ් චන්දන පරණවිතාන මයා.
7/3. කුඹුක්වැල්ල පලමු පටුමග,
රිච්මන්ඩ් කන්ද, ගාල්ල.

වගඋත්තරකරුවන් : 01 විදුහල්පති,
ගා/රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

02. ලේකම්,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
ගා/රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

03. ලේකම්,
අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
ගා/රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/MT/151/17**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තම දරුවා 2017 වර්ෂයේ 1 වන ශ්‍රේණිය සඳහා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයට ආසන්න පදිංචිය යන ගණය යටතේ ඇතුළත් කිරීම සඳහා CO-44 යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 90.75 ක් ලබා ඇති බවයි. නමුත් එම ලකුණු ප්‍රමාණය මත විදුහල මඟින් ප්‍රදර්ශිත තාවකාලික නාම ලේඛනයෙහි තම දරුවාගේ නම සඳහන් නොවීම හේතුවෙන් නැවත පෙත්සම්කරු විසින් අභියාචනා සහ විරෝධතා ගොනුකර එකී පරීක්ෂණය සඳහා පෙනී සිට ලකුණු 92.75 ක් ලබා ඇති බවද දක්වා ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

මෙම ලකුණු ප්‍රමාණය අනුව දරුවන් තෝරාගත් අවසන් ලැයිස්තුවේ පොරොත්තු ලේඛනයෙහි තෙවන ස්ථානයට තේරී පත්ව ඇතත්. මේ වන තෙක් විදුහල වෙත දරුවා ඇතුළත් කරගෙන නොමැති බවද දක්වා ඇත.

පැමිණිලිකරු විසින් තම පැමිණිල්ලෙහි දක්වා ඇති පරිදි තමාට වඩා අඩු ලකුණු ලැබිය යුතු බොහෝ පිරිසක් විදුහල මගින් අවසන් නාම ලේඛනයට ඇතුළත් කොටගෙන ඇති අතර. ඇතැම් අයදුම්කරුවන්ගේ නම් තාවකාලික නාම ලේඛනයෙහි හෝ සඳහන්ව නොමැති බවද එබැවින් ඔවුන් වෙත විරෝධතා දැක්වීමේ අවස්ථාවද පෙත්සම්කරුට අහිමි වී ඇති බවද දක්වා ඇත. මෙසේ ලකුණු අඩු විය යුතු පුද්ගලයන්ට ව්‍යාජව වැඩි ලකුණක් ප්‍රධානය කිරීමෙන් විදුහලෙහි කඩඉම් ලකුණු මට්ටම ඉහළ ගොස් ලකුණු 92.75 ක් ලැබුවද තම දරුවාට මේ වන විටත් අදාළ පාසලේ පාසල් අධ්‍යාපනය අහිමි වී ඇති බවද. ඒ හේතුවෙන් පහත දක්වන අයවලුන්ගේ ලිපිගොනු පරීක්ෂා කර බලා තමා වෙත සහන සලසා දෙන ලෙසද පැමිණිලිකරු විසින් ඉල්ලා සිට ඇත.

පැමිණිලිකරු දක්වා ඇති පරිදි වගඋත්තරකරු විසින් අංක 560- ඩබ්.එස්.එම්.සී වනසිංහ යන අය ස්ථිර පොරොත්තු ලේඛනයෙහි අංක 1 ට ස්ථානගත කිරීම දෝෂ සහගත වේ. මෙම ඉල්ලුම්කරුගේ නම තාවකාලික ලේඛනයෙහි සඳහන් නොවූ අතර ස්ථිර පදිංචිය උළුවිටිකේ ප්‍රදේශය හෙයින් පාසලට ඉතා දුරින් පදිංචි නිසාවෙන් ලකුණු 92.08 ක් ලැබීම විය නොහැකි බව දක්වා ඇත.

එසේම අංක 335 බී.වයි.බී.ටී.ටී ප්‍රසන්න යන අය ස්ථිර පොරොත්තු ලේඛනයෙහි අංක 2 ට ස්ථානගත කිරීමද දෝෂ සහගත බව පැමිණිලිකරු දක්වා ඇත. මෙම අයගේ නමද තාවකාලික ලේඛනයෙහි සඳහන් නොවන අතර සථිර පදිංචි ගාල්ලට බොහෝ දුරින් පිහිටි ගිංතොට බවට පැමිණිලිකරු දක්වා ඇත. එසේම දැනට සඳහන් ලිපිනයට ඡන්දහිමියන් ලෙස ඡන්ද නාම ලේඛනවල නම් සඳහන් නොවීමද මත ලකුණු 92.08 ක් ලද නොහැකි බව පැමිණිලිකරුගේ ස්ථාවරයයි.

338 වන ඩී.කේ පතිරණ යන අය ස්ථිර ලේඛනයෙහි නම සඳහන් පුද්ගලයෙක් වන අතර මොහුගේ නම තාවකාලික ලේඛනයෙහි සඳහන් නොවන බව පෙත්සම්කරු විසින් දක්වා ඇත. තවද පෙත්සම්කරු සඳහන් කර ඇති පරිදි මෙම පුද්ගලයාට සින්නක්කර ඔප්පුවක් නොමැති බව සහ ඡන්ද හිමි නාමලේඛනවල නම සඳහන් නොවීමද මත ලකුණු 93 ක් ලද නොහැකි බව පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේම අංක 365 යටතේ නම සඳහන් වන ප්‍රසන්න රත්නායක යන අයගේ නම තාවකාලික ලේඛනයෙහි සඳහන් නොවූවද සථිර ලේඛනයෙහි සඳහන් වන්නේ ලකුණු 93 ක් ලබාගෙන වේ. මෙම අයගේ නම් 2011 හා 2012 වර්ෂවල ඡන්ද හිමි නාම ලේඛනවල සඳහන් නොවීම පැමිණිලිකරු සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත. ඒ අනුව මෙම අයට ලකුණු 93ක් හිමිවිය නොහැකි බව පෙත්සම්කරු විසින් සඳහන් කර ඇත.

තවද අංක 573 හිමි සී.ඩී ගමගේ යන අයගේ නම තෝරාගත් ලේඛනයෙහි සඳහන් වුවද තාවකාලික ලේඛනයේ නම සඳහන්ව නොතිබූ බවට පැමිණිලිකරු දක්වා ඇති අතර මෙම අය 2011 වසර සඳහා

ඡන්ද හිමියන් ලෙස නම සඳහන් නොවන හෙයින් සහ ආසන්න පාසල් 02 ක් ඇති හෙයින් ලකුණු 17 ක් අහිමි වන බැවින් ලකුණු 95 ක් ලබා ගනිමින් ස්ථිර ලේඛනයට ඇතුළත්වීමට හැකියාවක් නොමැති බව පැමිණිලිකරු සිය ලේඛන මගින් පෙන්වා දී ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2017.06.02 දිනැතිව හා අංක ගා/රිච්/පා/06/02/2017 දරණ වාර්තාව වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ කරුණු අනුව මෙම පැමිණිලිකරුට මුල් සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු 90.75 ක් හිමිව ඇති අතර පසුව කරන ලද අභියාචනා විභාගය තුළින් එම ප්‍රමාණය ලකුණු 92.95 ක් බවට පත්ව ඇති බව සඳහන් කර ඇත.

මෙම ලකුණු ප්‍රමාණය මත පැමිණිලිකරු ස්ථිර පොරොත්තු ලේඛනයෙහි තෙවන ස්ථානයෙහි රැඳී සිටින බවත් පොරොත්තු ලේඛනයෙහි 1 හා 2 ස්ථාන වල නම් සඳහන් දරුවන් මේ වන විට පාසලට ඇතුළත් කර ඇති හෙයින් පැමිණිලිකරු මේ වන විට පොරොත්තු ලේඛනයෙහි පළමු ස්ථානයට පත්ව ඇති බවත් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණය :-**

2017.08.19 වන දිනැතිව පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර පැමිණිලි පාර්ශවය විසින් සිය මුල් පැමිණිල්ලේ කරුණු කොමිසම වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව පෙත්සම්කරු විසින් දක්වා ඇති අංක 560 ඩබ්.එස්.එම්.සී වනසිංහ නමින් ඇතුළත් කොට ඇති සෙනිත් හංසචි වනසිංහ දරුවාට අයත් ගොනුව කොමිෂන් සභාවේ විමර්ශනයට ලක්කොට ඇත.

මෙම ඉල්ලුම්කරු 41/1, වැකුණගොඩ පටුමග, බෝපේ, ගාල්ල යන ලිපිනයෙහි පදිංචි අතර විදුහල මගින් ලකුණු 92.8 ක් ලබා දී ඇති බවත් ස්ථිර පොරොත්තු ලේඛනහි අංක 01 ට නම සඳහන්ව ඇති මෙම දරුවා පාසලට ඇතුළත් කොට ගෙන ඇති බවත් නිරීක්ෂණය වී ඇත. එහි අංක 4888 දරණ විකුණුම්කර ඔප්පුව සත්‍ය පිටපතක් බවට සහතික කොට නොමැති අතර පැමිණිලිකරු විසින් මෙම අවස්ථාවෙහි කොමිසම වෙත ඉදිරිපත් කර සිටින ලද ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් සහතික කරන ලද පත්‍රිකා අංක A 387/278 ප්‍රකාරව අංක 4888 යනු විකුණුම්කර ඔප්පුවක් නොව බදු ඔප්පුවක් බව තහවුරු වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම ලේඛනය සඳහා ලකුණු 10 ක් ලබා දීම දෝෂ සහගත බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත තම පැමිණිල්ල මගින් දක්වා ඇති දෙවන ගොනුව වන CO 335 බී.වයි.බී තනුජා තුෂාරිකා නැමැති ඉල්ලුම්කරුගේ එච්.ජී.ඩී ලකින්ද දිසාර ජයතිස්ස නැමැති දරුවා 11/13 හීන්පැන්දල පාර, ගාල්ල ලිපිනයෙන් ඉල්ලුම් කර ඇති අතර ස්ථිර පොරොත්තු ලේඛනයෙහි අංක 2 ට නම් සඳහන්ව ඇත. එම දරුවා මේ වන විට විදුහලට ඇතුළත්ව ඇති අතර මෙම ගොනුව අනුව විදුහල මගින් ලකුණු ලබා දීම පහත පරිදි බවට සටහන් තබා ඇත.

| | | |
|---|---|---|
| ඔප්පුව | - | 10 |
| ඡන්ද හිමිකම | - | 35 |
| අතිරේක ලේඛන | | 2.8 |
| ආසන්නතාවය | - | 45 |
| | | ----- |
| එකතුව | - | 92.8 |
| | | === |

මෙම ඉල්ලුම්කරුගේ ලිපිනයේ පරමානන්ද විද්‍යාලයට දුර මීටර් 597.3 ක්ද සී.ඩබ්.ඩබ් කන්නන්ගර විද්‍යාලයට මීටර් 599.65 ක්ද, රිච්මන්ඩ් විද්‍යාලයට කිලෝ මීටර් 1.06 ක්ද ලෙසට ගොනුවෙහි සටහන් තබා ඇත. මේ අනුව ආසන්න පාසල් දෙකක් සඳහා ලකුණු අඩු විය යුතු වුවත් එක් පාසලක් සඳහා ලකුණු අඩුකර ඇති බව නිරීක්ෂණය වේ. මේ අනුව ලකුණු 92.8 ක් ලබා දීම දෝෂ සහගත බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු විසින් දක්වා ඇති තෙවන ගොනුව වන CO 338 ඩී.පී තීක්ෂණ යන අයගේ ගොනුව පරීක්ෂාවට ලක්කිරීමේදී මෙම අය ස්ථිර නාම ලේඛනයෙහි අනු අංක 79 යටතේ පාසලට ඇතුළත්ව ඇති අතර ඉල්ලුම්කරු පී.ඊ පතිරණ 12 ඒ. සපුමල් පෙදෙස. ගාල්ල යන ලිපිනයේ වේ. මෙම අය සඳහා විද්‍යාලය මගින් පහත පරිදි ලකුණු ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

| | | |
|---|---|---|
| ඔප්පුව | - | 4 |
| ඡන්ද හිමිකම | - | 35 |
| අතිරේක ලේඛන | | 4.25 |
| ආසන්නතාවය | - | 50 |
| | | ----- |
| එකතුව | - | 93.25 |
| | | === |

මෙම පතිරණ යන අයගේ ලිපිනයට අදාළව එම අයට ඡන්ද හිමිකම නොමැති බව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද ඡන්ද නාම ලේඛන මත කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වී ඇති අතර ඒ අනුව ඡන්දය සඳහා ලකුණු 35 ක් ලබා දීම විද්‍යාලය විසින් කුමන පදනමක් මත කළේද යන්න සඳහා වගඋත්තර පාර්ශවය විසින් කිසිදු පැහැදිලි කිරීමක් සිදුකර නොමැත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

පෙත්සම්කරු මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ වගඋත්තර පාර්ශවය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක 17/2016 දරණ පාසල් වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ ප්‍රතිපාදන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කරන ලද බවට සඳහන් කරමින් වේ.

ඒ අනුව පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත්තේ. වගඋත්තර පාර්ශවය විසින් පහත අය සඳහා ලකුණු ලබා දීමේදී ව්‍යාජ ලකුණු ලබා දීම තුළින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බව වේ.

| | |
|---|---|
| අංක 560 | ඩබ්.එස්.එම්.සී වනසිංහ |
| අංක 335 | බී.වයි.බී.ටී.ටී ප්‍රසන්න |
| අංක 338 | ඩී.කේ පතිරණ |
| අංක 365 | ප්‍රසන්න රත්නායක |
| අංක 573 | සී.ඩී ගමගේ |

මෙම ගොනු අතරින් අංක 560. 335 සහ 338 යන ගොනු පමණක් මෙකී පරීක්ෂණයේදී පරීක්ෂාවට ලක්කර ඇති අතර එම ගොනු සඳහා නීත්‍යානුකූලව හිමිවිය යුතු ලකුණුවලට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් හිමිකර දී ඇති බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත. මෙසේ නීත්‍යානුකූල චක්‍රලේඛනය පරිදි හිමිවිය යුතු ලකුණු ප්‍රමාණයට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් ඉහත අයදුම්කරුවන් හට ලබා දීමෙන් සහ ඔවුන්ගේ නම් තාවකාලිකව ලේඛනයෙහි ඇතුළත් නොවීමෙන් මෙම අය වෙත විරෝධතා දැක්වීමේ අවස්ථාවන්ද පෙත්සම්කරු වෙත අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු මත අංක 560 හිමි ඩබ්.එස්.එම්.සී වනසිංහ යන ඉල්ලුම්කරුට විදුහල මඟින් ලබා දී ඇති ලකුණු 92.08 ක් සඳහා හිමිකම් නොමැති බවත් එම අයට හිමි සැබෑ ලකුණු ප්‍රමාණය 86.08ක් වන බවත් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. මන්ද මෙම අය විසින් විදුහල වෙත ඉදිරිපත් කර ඇති අංක 4888 දරණ ඔප්පුව විකුණුම්කරයක් නොව බදු ඔප්පුවක් හෙයිනි. ඒ අනුව ඔප්පුවට ලබා දී ඇති ලකුණු 10 න් ලකුණු 6 ක් ඉවත් විය යුතුය.

විදුහල මඟින් සැබෑ අයදුම්කරුවන් හට ලකුණු ලබා දීමේදී පත්ඉරු පරීක්ෂාව සිදුකර ඇති බවට කරුණු පරීක්ෂාවේදී අනාවරණය වුවත් මෙම ගොනුව සම්බන්ධව පත්ඉරු පරීක්ෂා කිරීම සිදු නොකර ලකුණු ලබා දී ඇති බව කොමිෂන් සභාව වෙත පෙනී යන අතර තාවකාලික ලේඛනයට මෙම ඩබ්.එස්.එම්.සී වනසිංහ යන අයගේ නම ඇතුළත් නොවීම තුළින් පෙත්සම්කරු ඔහු වෙත විරෝධතා දැක්වීමට අවස්ථාවද අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව උක්ත ඩබ්.එස්.එම්.සී වනසිංහ යන අය ස්ථිර පොරොත්තු ලේඛනයෙහි අංක 1 ස්ථානගත කිරීම සඳහා විදුහල මඟින් ව්‍යාජ ලෙස ලකුණු ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම CO 335 හිමි එච්.ඒ.ඩී ලකින්ද දිසාර ජයතිස්ස යන අය සම්බන්ධව සලකා බැලීමේදී විදුහල සතු ගොනුව ප්‍රකාරව මෙම ඉල්ලුම්කරුට පාසැල් 02 ක් සඳහා ලකුණු අඩුවිය යුතු අතර එසේ වූ විට පාසල මඟින් ඔහු වෙත ලබා දී ඇති ලකුණු ප්‍රමාණය 92.08 ක් විය නොහැකි බවත් සත්‍ය ලකුණු ප්‍රමාණය තවත් එක් පාසලක් වෙනුවෙන් ලකුණු 5 ක් අඩුකළ විට ලකුණු 87.05 ක් විය යුතු බවත් පෙනී යයි. මේ අනුව මෙම ගොනුව සම්බන්ධව කටයුතු කිරීමේදී වගඋත්තර පාර්ශවයන් චක්‍රලේඛනය උල්ලංඝනය කරමින් ව්‍යාජ ලකුණු ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම CO 338 ඩී.පී තීක්ෂණ යන අයට අයත් ගොනුව අනුව එම අයට අදාළ ලිපිනයට ඡන්ද හිමිකම නොමැති බව නිරීක්ෂණය වී ඇති අතර ඒ අනුව ලකුණු 93.25 ක් ලබා දීම දෝෂ සහගත බවත් ඡන්දය සඳහා ලබා දී ඇති ලකුණු 35 අඩු කළ විට මෙම අයටද හිමි වන්නේ ලකුණු 58.25 ක් පමණක් වන බවත් ඒ අනුව මෙම ලකුණු ප්‍රමාණය මත අදාළ විදුහල වෙත ඇතුළත් වීමට උක්ත අය සුදුසුකම් නොලබන අතර වගඋත්තර පාර්ශවය ව්‍යාජ ලෙස ලකුණු ලබා දීමෙන් මෙම අය ඉහළ ලකුණක් ලබා අදාළ පාසලට ඇතුළත්ව ඇති බවද නිරීක්ෂණය වේ.

අදාළ රිච්මන්ඩ් විදුහල වෙත ආසන්නතාවය යන පදනම මත ළමුන් බඳවාගෙන ඇති කඩඉම් මට්ටම 92.8 ක් වන අතර මෙසේ සත්‍ය ලෙස ලකුණු 92.08 ක් සඳහා හිමිකම් නොමැති පුද්ගලයන් තිදෙනෙකු මෙම ඉල්ලුම්කරුගේ නමට ඉහළින් ස්ථානගතව රැඳී සිටීම හේතුවෙන් ඉල්ලුම්කරු සත්‍ය ලිපිලේඛන මත ලබාගත් ලකුණු 92.75 මත අවසන් පොරොත්තු ලේඛනයෙහි අංක 3 ට පත්ව ඇත.

පරීක්ෂණයේදී සලකා බලන ලද ඉල්ලුම්කරුවන් තිදෙනාගේම දරුවන් මේ වන විට රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත්ව අධ්‍යාපනය ලබන අතර. විදුහල මඟින් ඔවුන් වෙත ව්‍යාජ ලකුණු ප්‍රධාන කිරීම හේතුවෙන් ඔවුන් අවසන් ලැයිස්තුවට හා අවසන් පොරොත්තු ලේඛනයට ඇතුළත්ව ඇත. එසේම ඔවුන්ගේ නම් තාවකාලික ලේඛනයේ සඳහන් නොවීම තුළින් පෙත්සම්කරුට ඔවුන් වෙත විරෝධතා දැක්වීමේ අයිතිය වළක්වා ඇත. මේ අනුව වගඋත්තරකරුවන් විසින් අක්‍රමවත් ලෙස ඉහත ළමුන් බඳවා ගැනීම හේතුවෙන් නියමිත ලකුණු සීමාව කරා පැමිණ ඇති මෙම පැමිණිලිකරුගේ දරුවා හට පාසලට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය වේ.

එසේම මෙම පැමිණිල්ල මඟින් පෙත්සම්කරු දක්වා ඇති 560. 335 සහ 338 යන අයදුම්කරුවන් සඳහා මුල් සම්මුඛ පරීක්ෂණයේදීම ලකුණු 92.8. 92.8 සහ 93.25 ලෙස පිළිවෙලින් ලබා තිබියදී ඔවුන්ගේ නම් තාවකාලික ලේඛනයට ඇතුළත් නොවූයේ මන්ද යන ගැටළුව පැන නඟින අතර ඒ සඳහා වගඋත්තරකරුවන් විසින් පිළිතුරු ලබා දීමක් සිදු නොකරන ලද බවද සටහන් කර ඇත.

මෙම සියළු කරුණු මත නිරීක්ෂණය වී ඇත්තේ උක්ත අය සඳහා අදාළ වගඋත්තර පාර්ශවය විසින් චේතනාන්විතව ඔවුන්ට නීත්‍යානුකූලව හිමි නොවන ලකුණක් ප්‍රධානය කර රිච්මන්ඩ් විද්‍යාලයේ 1 වසර සඳහා ඇතුළත් වීමට සුදුස්සන් බවට පත්කර ඇති බවයි. වගඋත්තරකරුවන්ගේ මෙම ක්‍රියාවලිය තුළින් අදාළ චක්‍රලේඛනයෙහි 6.1 උප වගන්තිය සහ 10.0 තුළ දක්වන අභියාචනා හා විරෝධතා ඉදිරිපත් කිරිමට ඇති අයිතිය ද උල්ලංඝනය වී ඇත.

මෙම ක්‍රියවලිය හේතුවෙන් පැමිණිලිකරු වෙත. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කර දී ඇති 'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරිමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය' යන අයිතිය උල්ලංඝනය වී ඇති බවට කොමිෂන් සභාව තීරණය කර සිටී.

නිර්දේශය :-

1. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන බී.එස් පරණවිතාන දරුවා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ දෙවන ශ්‍රේණියට (2017 වර්ෂයේ පළමු වසරට) ඇතුළත් කළ යුතුය.

2. මෙම නිර්දේශයේ පිටපතක් ලේකම්. අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන අතර. පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට අදාළ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා කටයුතු කළ යුතු බවට දන්වා සිටිමි.

2018.03 . 26 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/